තහංචි මැද්දෙන්

පුරවැසි මාධ්‍යකරුවකුගේ සටහන්

20070127

# දේවගැතිවරයාගේ මරණය

ජනවාරි 13වන සෙනසුරාදා යාපනයේ වෙම්බඩි පාරේ පුස්තකාල හන්දියේ දී මිනිසෙකු වෙඩිතබා මරා දැමුණි. එය දැන් සාමාන්‍යයෙන් යාපනයේ නිරන්තරයෙන් අසන්නට ලැබෙන දුක්මුසු පුවතකි.

එම ඝාතනය සම්බන්ධයෙන් ජාතික ආරක්ෂාව පිළිබඳ තොරතුරු මධ්‍යස්ථානය මෙසේ කීවේය: *පුස්තකාල හන්දියේ පිහිටි මුර පොලෙහි සොල්දාදුවන්ට අත් බෝම්බයක් දමා ගැසීමට උත්සාහ කළ ත්‍රස්තවාදියකු හමුදා වෙඩි පහරින් මිය ගියේ ය. මරණය සිදුව තිබුනේ ළඟ සිට තැබූ වෙඩි පහරිනි.*

කොළඹ පුවත්පත් පළ කළේ ද එම පුවතයි.

මෙසේ වෙඩි පහරින් මිය ගොස් ඇත්තේ නල්ලතම්බි ඥානසීලන් නම් ක්‍රිස්තියානි දේවගැතිවරයා බව පවුලේ ඥාතීන් දැන ගත්තේ පසුදා ඉරිදා ය.

ඇත්ත වශයෙන් නම් සිදුව තිබුනේ මෙය යි:
උදෑසන සියයතුරු පැදියෙන් සිය බිරිඳ සහ දියණිය කැටිව ගිය ඥානසීලන් දේවගැතිවරයා ප්‍රතිකාර ගෙන ආපසු එන ලෙස ඔවුන් එහි රඳවා ගියේ සිය දේවස්ථානයට ය. ආපසු නිවෙසට ගිය බිරිඳ සහ දේවගැති ඥානසීලන් අතුරුදහන්ව ඇතැයි සොයන්නට පටන් ගත්තේ පසුදා ය. 13 දා හතර දෙනෙකු යාපනයේ දී වෙඩි තබා මරා දමා තිබුනි. ඒ අතර ඥානසීලන් ඇතැයි ඥාතීන් කල්පනා කළේ නැත.

ඔහු වෙත තිබූ ජාතික හැඳුනුම්පත  බයිබලය   සහ පැද ගිය යතුරු පැදිය මළ සිරුර බාරගත් පොලීසියට හමු වූයේ නැත. රෝහලට බාර දුන්නේ ඒ කිසිවක් නැති හඳුනා ගත නොහැකි මළ සිරුරකි. හැඳුනුම්පත සහ බයිසිකලය අතුරුදහන් වී තිබුණි.

තිස්හත් හැවිරිදි ඥානසීලන් යනු යාපනයේ ක්‍රිස්තියානි ප්‍රජාව අතර දන්නා කියන දේවගැතිවරයෙකි. ඔහු සිය දේවස්ථානය කරා ආපසු යමින් සිටියේ සිය බිරිඳ සහ දියණිය රෝහලට ඇරලීමෙන් පසු බව ඒ හැම කෙනෙක්ම දනිති. නමුත් ජනමාධ්‍යවේදීන් සත්‍ය තොරතුරු සඳහා විමසිය යුතු බවට නියෝග කර ඇති ජාතික ආරක්ෂාව පිළිබඳ තොරතුරු මධ්‍යස්ථානයට අනුව ඒ ත්‍රස්තවාදියෙකි.

නමුත් ඒ මරා දමා තිබුණේ අහිංසක මිනිසෙකි.

ආණ්ඩුවකට හෝ සන්නද්ධ ව්‍යාපාරයකට බිය වැද්දවීමෙන් සිය සුපාතබව කිසිදු ජන කොටසක් හමුයේ තහවුරු කළ නොහැකි ය. යාපනයේ අද සිදුවන බියකරු ක්‍රියාවන් විසින් දෙමළ ජනයා තවතවත් කොළඹ සිංහල අධිපත්‍යවාදී ආණ්ඩුවෙන් ඉවතට පළවා හැරෙන බව ඉගෙන ගැනීමට රජතුමා හෙළුවෙන් යැයි කදරු කෑ ගසා කියන තුරු සිටිය යුතු ද?

# අම්බලන්ගොඩ ඝාතන

අම්බලන්ගොඩ රන්බඩු සැලක් කොල්ල කෑ හය දෙනෙකුගෙන් යුත් සොර මුලක් එතැනට ආ පොලිස් නිලධාරීන් දෙදෙනෙකුට වෙඩි තබා මරා දැමූහ. ඉන් දෙදිනකට පසු එම සොරුන්ගෙන් තිදෙනෙකු මිය ගිය බව වාර්තා විය.

සිය රාජකාරියේදී මිය ගිය එම නිලධාරීන් ගැන අපි සියළු දෙනාම ශෝක වෙමු.

ඉතිරි කතාව මෙසේ ය. පොලීසිය මෙම සොරුන් තිදෙනා අල්ලා ගෙන ඉතිරි අය සොයන්නට ගියහ. එවිට එක් සොරකු මැෂින් තුවක්කුවක් උදුරාගෙන පොලීසියට වෙඩි තැබීමට තැත් කලේ ය. වෙඩි වැදුනේ අනෙක් සොරුන් දෙදෙනාට ය. පසුව පොලිස් වෙඩි පහරින් ඒ සොරා ද මියෑ දුනි.

පුවත්පත් වාර්තා කලේ ද එසේ ය. නමුත් කිසිවකු මේ කතාව විශ්වාස කරන්නේ නැත. මෙයට පෙර රත්ගම දී ද මෙම සිදුවීම කාබන් කොපියක් සේ වාර්තා විය. පොලිස් නිලධාරියකුට ද සොරුන් ඇල්ලීමට යාමේ දී වෙඩි වැදී මිය ගිය අතර ඔහුගේ ඥාතීන් පවා එම කතාව විශ්වාස කළේ නැත.

මේ අනුව මෙම සොරුන් රැගෙන ගොස් ඇත්තේ මංචු දාන්නේ නැතිව ය. මාංචු නොදමා මෙම භයානක සොරුන් රැගෙන ගිය පොලිස් නිලධාරියා සිය රාජකාරිය පැහැර හැරියේ නැත් ද? පොලිස් අත් අඩංගුවට පත්වන ඕනෑම අයෙකුගේ ජීවිතය රැකදීමට පොලීසිය බැඳී නැත් ද? ඔවුන් පිටතට ගෙන යන විට යෙදූ ලොග් සටහනක් වේ ද? මෙලෙස අත් අඩංගුවට ගත් අය එම සොරකමට සම්බන්ධ බව සියයට සියයක්ම සනාථ කර ඇත් ද?

කිසිම ජනමාධ්‍යක් එම ප්‍රශ්න විමසා තිබුනේ නැත. එවිට ජනමාධ්‍ය මුර පල්ලා වෙනුවට ඉටුකරන්නේ ගිරා පොතක වැමෑරීම යි.

අපරාධයන්ට දඬුවම් දිය යුත්තේ අධිකරණය මිස පොලීසිය නොවේ. පොලීසියට අපරාධකරුවන් හරියටම හඳුනා ගත හැකි නම් නීති පද්ධතියක් අවශ්‍ය ද නැත. මෙරට අපරාධයන්ගෙන් සියයට 95 ක්ම විසඳීමට තරම් කරුණු ඉදිරිපත් කිරීමට පොලීසිය අසමත් වෙයි. බොහෝ පාතාල නායකයෝද මිනී මරුවෝද සුවසේ ජීවත් වෙති.

නමුත් කොහි දී හෝ අපරාධකරුවකු විසින් පොලිස් නිලධාරියකු මරා දැමුවහොත් දින දෙක තුනක් ඇතුළත ඒ අපරාධකරුවා ඉහත කී ආකාරයට වෙඩි කා නසී.

ඉන් මිය ගිය පොලිස් නිලධාරීන්ගේ දරු පවුල්වලට ඇතිවන සෙතක් ද නැත. මේ ක්‍රියා පිළිවෙත පොලිසියට සුජාතබවක් ගෙන දෙන්නේ නැත. සමාජයට නීතියේ පිලිසරණ පිලිබඳ විශ්වාසයක් ඇතිවන්නේ නැත. ඇතිවන්නේ උන් මරා දැමුවා යන පළි ගැනීමේ අදහස පමණි. නමුත් අපේ ජනමාධ්‍ය ද දේශපාලඥයින් ද නිහඬ ය. අවාසනාව එය යි.

# එන්ජීඕ - කොටි රෝහල

නැගෙනහිර එල්ටීටීඊ කඳවුරක් එස්ටීඑෆ් බලකාය විසින් අල්ලා ගත් අවස්ථාවේ එහි එන්ජීඕ රෝහලක් පැවැති බව ආරක්ෂ ප්‍රකාශක අමාත්‍ය කෙහෙලිය රඹුක්වැල්ල කියා සිටියේ ය. එම එන්ජීඕ ව ZOA නම් ඕලන්ද ආයතයක් බවද කියැවුණි. ZOA යනු සරණාගතයින්ට සහන සළසන ඕලන්ද රාජ්‍ය නොවන සංවිධානයකි.

ඉන් අනතුරුව ජාතික හෙළ උරුමයට සම්බන්ධ පිරිස් කොළඹ පිහිටි එම කාර්‍යාලය වටලා විරෝධතා උද්ඝෝෂනයක් කළහ. සේවි ද විල්රන් ආයතනයට එරෙහිවද උද්ඝෝෂනයක් සංවිධානය කරන ලදී. එවැනි පිරිස් ලියූ ලිපි වලද ඒ බව යළි යළි දක්වා තිබුණි.

නමුත් පසුව ආරක්ෂ අමාත්‍යාංශය එම පුවත වරදක් බව ZOA වෙත දන්වා සිටියේ ය. වර්ධනය වූ යුද තත්වය නිසා තමන් 2006 අගොස්තුවේ සිට නැගෙනහිර සිය කටයුතු නතර කල බවත් තමන් කිසිදු සන්නද්ධ කණ්ඩායමකට උදව් කර නැති බවත් කියා සිටි ZOA ආයතනය තමන් විසින් තංගවේලායුදපුරම් ගම්මානයෙහි කරන ලද පුනරුත්ථාපන කටයුතු ලැයිස්තුවක් ද ප්‍රසිද්ධියට පත් කළේ ය.

ඒ කිසිවක් අපට අසන්නට ලැබුණේ නැත. අප ජීවත්වන්නේ තොරතුරු සමාජයක යැයි කියනු ලැබේ. ඇත්ත වශයෙන් ම නම් ශ්‍රී ලංකාවේ අප ජීවත්වන්නේ අඳ ගොලු බිහිරි සමාජයක ය. උතුරේ මෙන්ම දකුණේ ද යුදවාදයට ඒ තරම් වෙනත් වාසියක් නැත.

# වෑද්දුම්කරු බූස්සට

කොළඹට නුදුරු නගරයක පසුගිය වසර 11 පුරාම වෑද්දුම්කරුවකු ලෙස සේවය කළ යාපන වැසි දෙමළ තරුණයකු සොදිසි කිරීමක දී අත් අඩංගුවට ගැනුනි. මෙම තරුණයාට සිංහල මිතුරන් බොහෝ විය. ඔව්හු පොලීසියට ගොස් රම තරුණයා මුදා ගැනීමට වෑයම් කළහ. නමුත් අන්තිමේ දී ඔහු බූස්ස කඳවුරට යැවුනි.

මෙම තරුණයා දන්නා අප ජනමාධ්‍යවේදියකු ද මෙම වෑයමට හවුල් විය. අවසානයේ දී ඔහු දින නියමයක් නැති සිර ගෙදරකට යැවීම ගැන අදාළ පොලිසි නිලධාරියා විමසී ය. ලැබුණු පිළිතුර මෙය යි:

*,ඔහු කොටියෙක් නොව බව අප දන්නවා. ඒත කොටි ඇවිත් ඔහුට බොම්බයක් තියන්න කීවොත් ඔහුට ඒක කරන්න වේවි. ඒක නිසා හොඳම දේ තමයි බූස්සට දාන එක,*

1988 -90 සමයේ මෙලෙසම බූස්සට යැවූ සංහල තරුණයින් ගැන අපට තිබූ කැක්කුම මේ වෑද්දුම්කරු ගන අපට නැත.

ඇයි?

එම ප්‍රශ්නයට ලැබෙන පිලිතුර මෙරට ජනවාර්ගික ප්‍රශ්නයේ මුල ය.

සුනන්ද දේශප්‍රිය